# ඇබෑර්තු දැන්වීමයි

## සීමාසහිත මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතිය

## පුරප්පාඩු ලේකම් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

සීමාසහිත මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතියේ පුරප්පාඩු වී පවතින ලේකම් තනතුර සඳහා මාතලේ දිස්ත්‍රික්කය තුළ පදිංචි සුදුසුකම් ලාභීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුරට අදාළ සුදුසුකම්**

අ. සාමාජික සම්බන්ධතා හා පුහුණු කිරීමේ නිලධාරි තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක / කළමනාකරු -1 (ස.ණ.ස. සමිති/ වෙනත් මූල්‍ය ආයතන) වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / පරිපාලක (වෙළඳසැල් ) තනතුරක ගිණුම් සහකාර තනතුරක වසර 10 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

ආ. මාස 09 ට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත මානව සම්පත් කළමනාකරණය / ලේකම් පරිචය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත් වීම සමඟ සාමාජික සම්බන්ධතා හා පුහුණු කිරීමේ නිලධාරි තනතුරක වසර 02ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක කළමනාකරු -(ස.ණ.ස. සමිති/ වෙනත් මූල්‍ය ආයතන) වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / පරිපාලක (වෙළඳසැල් ) තනතුරක වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ගිණුම් සහකාර තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

ඇ. අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 04 කින් සමත්වීම (පැරණි නිර්දේශය)/ විෂයයන් 01 කට සම්මාන සහිතව විෂයයන් 03 කින් සමත් වීම ( නව නිර්දේශය)/ සමුපකාර උසස් පෙළ සමත් වීම.

හෝ

ඈ. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමත් වී තිබීම

i. **වැටුප් හා දීමනා**

- වැටුප් පරිමාණ අංකය - SL- 04 : 02
- වැටුප් පරිමාණය- 27000 - 540X10 - 810X10 - 1080X10 = 51300/-
- වැටුපට අමතරව මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත දීමනා හිමිවේ.
- තම කාර්ය සාධනය අනුව ආකර්ෂණීය දිරි දීමනා සඳහා හිමිකම් ඇත.

ii. **වයස් සීමාව :**

වයස් සීමාව අවු. 18 - 45 අතර

iii. **පොදු කරුණු**

- අයදුම්කරුවන් මාතලේ දිස්ත්‍රික්කය තුළ පදිංචිකරුවන් විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් ඉටු කිරීම සඳහා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත පුද්ගලයින් විය යුතුය.
- ලේකම් තනතුර පිළිබඳ ලබා ඇති පුහුණුව විශේෂ සුදුසුකමක් වනු ඇත.
- පරිගණක දැනුම හා ඉංග්‍රීසි දැනුම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

iv. **අයදුම්පත් යොමු කිරීම**

- අයදුම්පත් මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අංක 2/2011 චක්‍රලේඛයේ සඳහන් ආකෘතියට අනුව සකස් විය යුතුය.
- 2/2011 චක්‍රලේඛනය අනුව සකස් කළ අයදුම්පත් සී/ස මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතියේ පලාත්වල පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් ද ලබාගත හැකිය.
- අසම්පූර්ණ හා අයදුම්පත් භාර ගැනීමේ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද, පදිංචිය සනාථ කිරීමේ සහතිකය, ජාතික හැඳුනුම්පත හා උප්පැන්න සහතිකය යන සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ යුතුයි.
- **අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2024.02.10 දින වේ.**

ඉහත සඳහන් ලේකම් තනතුරට ඔබත් සුදුස්සෙක් නම් නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත ලිපිනයට, අයදුම්පත් භාර ගැනීමේ දිනට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න.

**ගරු සභාපති,**
**සී/ස මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතිය, පලාපත්වල, මාතලේ.**
**066-2220335 / 2220333/2220383**